**බීඕසී ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2016**

**---------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බීඕසී ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි (“සමාගම”) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව යටතේ මෙම වාර්තාව නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( “අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**------**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නීතිමය හා නියමිත අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, පහත දැ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණන සීමාකිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය නම්,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල බව.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ත්‍යාග, අනුග්‍රහ දැක්වීම් වැනි බදු අයකල හැකි ආදායම ගණනය කිරීමේ දී ඉඩ නොදෙන වියදම් එකතුව රු.1,091,650 ක් අඩුකර තිබීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු වියදම රු.305,662 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

2016 දෙසැම්බර් 31 දිනට පැවති රු. 122,058,073 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු. 31,148,364 ක ශේෂ එකතුවක් සෘජු තහවුරුකිරීම් නොමැති වීම හේතුවෙන් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ඉදිරිපත් නොකළ චෙක්පත්**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,702,009 ක් වටිනා ඉදිරිපත් නොකළ චෙක්පත් ජංගම වගකීම් යටතේ දක්වා ඇති අනෙකුත් ගෙවිය යුතු ශේෂයන්හි ඇතුලත් කර තිබුණි. එය මාස 06 කට ඉහත දී සමාගම විසින් නිකුත් කල රු.1,598,873 ක් වටිනා චෙක්පත්වලින් සමන්විත වූ අතර ඒ අතර 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නිකුත් කළ රු.1,590,505 ක් වටිනා චෙක්පත්වලින් සමන්විත විය.

**(ආ) නොපියවූ ශේෂ**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. ගණුදෙනුකරුවන් විසින් වෙන්කර අවලංගු කරන ලද සංචාර වෙනුවෙන් ලබා දී තිබූ මුදල් ඇතුලත් කරමින් ලැබූ අරමුදල් ආපසු ගෙවීමේ ගිණුමක් පවත්වාගෙන යන අතර වර්ෂය අවසාන දිනට ශේෂය වූ රු.12,736,429 ක් තුළ රාජ්‍ය ආයතනවලට ගෙවිය යුතු රු.1,237,985 ක වටිනාකමක් ඇතුලත් විය. ඉහත ණය ශේෂයන් සාධාරණ කාලපරිච්ඡේදයක් තුළ දී ගණුදෙනුකරුවන්ට පියවීමට සමාගම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ii. ගණුදෙනුකරුවන්ගෙන් ලද අත්තිකාරම් යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් සමාගම විසින් පවත්වාගෙන ගොස් ඇති අතර වර්ෂය අවසාන දිනට ගිණුමේ ශේෂය රු. 14,680,125 ක් වූ අතර රාජ්‍ය ආයතන වලින් ලද අත්තිකාරම් රු.7,229,469 ක වටිනාකමක් හෙවත් ඉහත ශේෂයෙන් සියයට 49 ක් ඒ තුළ නියෝජනය විය. කෙසේ වෙතත්, සමාගම සැලකිය යුතු කාලපරිච්ඡේදයක් තුළ දී මෙම දිගුකාලීන හිඟ ණය ශේෂයන් පියවා දැමීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

iii. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව එකතුව රු. 2,745,918 ක් වූ ගෙවිය යුතු දිගුකාලීනව හිඟ ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

ඉදිරිපත් නොකල චෙක්පත්, ආපසු ගෙවිය යුතු අරමුදල්, ගනුදෙනුකරුවන්ගෙන් ලද අත්තිකාරම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ආදිය අවුරුදු 05ක් ඉකුත් වූ පසුව ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගැනීම සමාගමේ ප්‍රතිපත්තිය බව සමාගමේ කළමනාකාරිත්වය විගණනයට දැනුම් දී තිබුණි. ඒ අනුව 2012 වර්ෂයට ඉහත දී පැවති ශේෂයන් ගණුදෙනුකරුවන්ට දැනුම් දීමකින් තොරව ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඇ) නැවත අයකර නොගත් එකතු කළ අගය මත බදු (VAT)

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වූ එකතුකල අගය මත බදු වටිනාකම වූ රු. 4,877,074 ක ශේෂය අය කරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මතභේදාත්මක ශේෂයන්

ණයගැතියන් විසින් තහවුරු කල ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වූ පහත ණයගැති ශේෂයන් සමඟ එකඟ නොවීය.

| ණයගැතියාගේ නම | ලෙජර් ගිණුම් අනුව ශේෂය | සනාථන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පාර්ලිමේන්තුව | 2,624,702 | 846,400 | 1,778,302 |
| අගමැති කාර්යාලය | 1,323,443 | - | 1,323,443 |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාගමේ මෙහෙයුම් පසුගිය වර්ෂයේ බදුපෙර ශුද්ධ ලාභය වූ රු. මිලියන 40.01 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ පෙර ලාභය රු. මිලියන 33.29 ක ප්‍රතිඵලයක් වී තිබුණු අතර මෙය මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු. මිලියන 6.72 ක් හෝ සියයට 16.79 ක් පෙන්නුම් කරයි. මෙම මූල්‍ය ප්‍රතිඵලයන්ගේ පිරිහීම සඳහා 2014 වර්ෂයේ රු. මිලියන 80.4 ක් වූ අලෙවි ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 74.48 ක් දක්වා අඩු වීම සඳහා ප්‍රධානම හේතුව විය.

## 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය විග්‍රහය

### 3.2.1 ලාභදායිත්වය

පසුගිය වර්ෂ 04 ක හා සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයන්ගේ සාරාංශය පහත වගුවෙන් ඉදිරිපත් කෙරේ.

රු. 000

| වර්ෂය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| ආදායම | 74,488 | 72,978 | 80,400 | 73,655 | 67,961 |
| බදු පසු ලාභය | 26,517 | 32,745 | 27,020 | 35,045 | 42,674 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

2012 වර්ෂයේ දී සමාගමේ ලාභය රු. මිලියන 42.67 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දී එම ලාභය රු. මිලියන 26.51 ක් හෙවත් සියයට 37 ක් දක්වා අඩු වී තිබුණි. සමාගම එහි ලාභදායිත්වය ඉහළ නංවා ගැනීමට සැලකිය යුතු අවධානයක් යොමුකර නොතිබුණි.

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

මූල්‍ය ප්‍රකාශනයන්ට හා විගණනයට ලැබී ඇති තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ වැදගත් අනුපාතයන් කීපයක් පසුගිය වර්ෂ 04 ක් සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාතය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත (සියයට)** | | | | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 2.3 | 3.0 | 2.6 | 3.9 | 5.7 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය | 11 | 15 | 15 | 20 | 28 |
| හිමිකම මත ප්‍රතිලාභය | 15.7 | 21 | 19.5 | 26.7 | 38.9 |
| **ක්‍රියාකාරි අනුපාත** | | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන) | 12 | 19 | 17 | 15 | 21 |
| ණයගැති පිරිවැටුම් කාලය (දින) | 29 | 19 | 21 | 23 | 17 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන මත)** | | | | | |
| ජංගම අනුපාතය | 3.53 | 3.83 | 4.7 | 4.26 | 3.35 |
| මුළු වත්කම් වලට ශුද්ධ ජංගම වත්කම් | 0.67 | 0.70 | 0.72 | 0.69 | 0.62 |

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ගමන් නියෝජිතයෙක් , සංචාරක මෙහෙයවන්නෙක් , සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙක් හා ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ට පහසුකම් සැපයීම හෝ විදේශ ගතවන ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ප්‍රවාහන පහසුකම් ලබාදීමේ ව්‍යාපාර සිදු කිරීම සමාගමේ අරමුණ වේ.

ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ 04 කාලය තුළ කරගෙන යනු ලැබූ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල කාර්යය සාධනය පහත දැක්වේ.

| | වර්ෂය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| (අ) | **සාමාන්‍ය ටිකට්පත්** | | | | | |
| | නිකුත් කල ගුවන් ටිකට් පත් සංඛ්‍යාව | 19,845 | 20,438 | 18,513 | 19,000 | 17,391 |
| | මුළු ආදායම (රු.000) | 1,368,562 | 1,282,015 | 1,257,283 | 1,138,849 | 1,125,507 |
| | ආපසු එවූ ගුවන් ටිකට්පත් සංඛ්‍යාව | 356 | 294 | 324 | 297 | 218 |
| | මුළු ආපසු එවූම් (රු.000) | 52,745 | 43,633 | 50,160 | 41,222 | 28,963 |
| (ආ) | **දඹදිව සංචාර** | | | | | |
| | සංවිධානය කළ සංචාර සංඛ්‍යාව | 27 | 22 | 19 | 15 | 20 |
| | මුළු ආදායම (රු.000) | 72,214 | 54,053 | 48,196 | 33,621 | 39,065 |
| (ඇ) | **අභ්‍යන්තර සංචාර** | | | | | |
| | සංවිධානය කළ සංචාර සංඛ්‍යාව | 16 | 25 | 24 | 14 | 27 |
| | මුළු ආදායම (රු.000) | 2,965 | 4,890 | 5,546 | 3,009 | 11,153 |
| (ඈ) | **එතෙර සංචාර** | | | | | |
| | ගමන් කළ මඟීන් සංඛ්‍යාව | 642 | 520 | 658 | 608 | 591 |
| | මුළු ආදායම (රු.000) | 32,525 | 21,150 | 35,906 | 28,866 | 14,700 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

i. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී 2016 වර්ෂයේ දී නිකුත්කළ ගුවන් ටිකට්පත් සංඛ්‍යාව සියයට 03කින් අඩු වී තිබුණි.

ii. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී රට අභ්‍යන්තර සංචාර සංඛ්‍යාව සුවිශේෂි ලෙස සියයට 36 කින් අඩු වී තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී රටින් එතෙර සංචාර සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දී සියයට 23 කින් වැඩි වී තිබුණි.

iii. 2016 වර්ෂයේ දී රට අභ්‍යන්තර සංචාරයන් සඳහා සමාගම විශාල පිරිවැයක් දරා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මේ සංචාරයන්ගේ ලාභදායිත්වය ප්‍රමාණවත් මට්ටමක නොපැවතිණි. රට අභ්‍යන්තර සංචාරයන්ගේ ආදායම රු. 2,965,264 ක් සහ විකුණුම් පිරිවැය රු. 2,634,556 ක් විය.

වාර්ෂික අයවැයට අනුව, සමාගම මෙම ක්‍රියාකාරකම් වලින් රු. 2,600,000 ක ලාභයක් ඉපයීමට අපේක්ෂා කළද සත්‍ය ලාභය රු. 330,708 ක් පමණක් විය. එය 2015 වර්ෂයේ ලාභය වූ රු. 1,003,795 ක් සමඟ සැසඳීමේදී සියයට 67 ක පිරිහීමක් විය.

## 4.2 මතභේදාත්මක ස්වභාවයේ ගණුදෙනු

2016 වර්ෂයේ දී සිදුකළ එතෙර සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම ආශ්‍රිත සියළු වැඩ සටහන් 4 සඳහාම නිලධාරීන් දෙදෙනෙක් පමණක් සහභාගී වී තිබුණි. 2016 වර්ෂයේ දී විදේශ ගමන් වියදම් සඳහා සමාගම රු. 1,814,124 ක මුදලක් වැය කර තිබුණු අතර එය මුළු විදේශ ගමන් වියදම්වලින් සියයට 74 ක් නියෝජනය වූ බව නිරීක්ෂණය විය.

## 4.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

i. රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු. 87,895,289 ක ශේෂයක් හෙවත් සියයට 72 ක් මුළු වෙළඳ ණයගැති ශේෂය වූ රු. 122,058,073 කින් නියෝජනය විය. ණය ප්‍රතිපත්ති අත්පොත අනුව රාජ්‍ය ආයතනවලට දින 60 ක ණය කාලපරිච්ඡේදයක් ලබා දී තිබුණි. කෙසේවුවද ලබාදී ඇති ණය කාලපරිච්ඡේදය තුළ හිඟව පවතින ශේෂය එකතු කර ගැනීමට සමාගමට නොහැකි වී ඇත. නොපියවූ මුළු හිඟ ණය ශේෂ වටිනාකම රු. 25,182,979 ක එකතුවක් හෙවත් සියයට 28 ක් දින 90 ඉක්මවා ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. මෙම දිගුකාලීන හිඟ ණයගැති ශේෂයන් අයකර ගැනීමට සමාගම ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

ii. බොල්ණය ලෙස සමාගම විසින් රු. 3,065,983 ක වටිනාකමක් 2016 වර්ෂය තුළ දී කපා හැර තිබුණු අතර මෙම ශේෂයන්ගෙන් සියයට 75 ක් නියෝජනය වන්නේ සමාගමේ සේවකයින් හතර දෙනෙක් විසින් කරන ලද පුද්ගලික ගණුදෙනුය.

# 5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම වෙනුවට ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 5.2 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 පරිච්ඡේදයේ අවශ්‍යතාවය අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.3 අයවැය පාලනය

අයවැය ගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

විගණන ක්‍රියාවලිය තුලදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් පිළිබඳව කාලයෙන් කාලයට සමාගමේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත පාලන ක්ෂෙත්‍රයන්ට අවධානය යොමු කිරීම අවශ්‍ය කරනු ලැබේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වාර්තා ලේඛන නඩත්තු කිරීම | සමාගම එක් එක් ණයදෙනුකරුවෙකුගේ නමින් ලැබිය යුතු ශේෂයක් පවත්වාගෙන යාම වෙනුවට ණයදෙනුකරුවන් ගණනාවක් හසුරුවන සේවා නියුක්තිකයන් නමින් ශේෂයන් අඩංගුකර ලැයිස්තුවක් නඩත්තු කර තිබුණි. |
| (ආ) | ආදායම හඳුනා ගැනීම. | ණයදෙනුකරුවන්ගෙන් ලද අත්තිකාරම් හා ණයදෙනුකරුවන්ට ආපසු ගෙවිය යුතුව ඇති මුදල් අවුරුදු 05 ක කාලපරිච්ඡේදයකින් පසුව ණයදෙනුකරුවන්ගෙන් තහවුරුකිරීම් ලබා ගැනීමෙන් තොරව ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. |
| (ඇ) | ණයදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු හිඟ එකතු කර ගැනීම් | රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල් ණය කාලපරිච්ඡේදය තුල එකතු කරගෙන නොතිබුණි. |